# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

## මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

## தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 07.
Tel: +94 11 2565304 – 6, 5552746, 5552748, Fax:+94 11 4714460
E-mail: cpa@cpalanka.org, Website: www.cpalanka.org

**මඩකළපුව දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණය පිලිබඳව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ප්‍රකාශය**

මැතිවරණ කොමසාරිස් වරයා විසින් 2007 දෙසැම්බර් මාසයේදී මඩකලපුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 9ක් සඳහා මැතිවරණ පැවත්වෙන බව නිවේදනය කළ අවස්ථාවේ පටන් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) විසින් මෙම මැතිවරණය පැවැත්වීමේ ක්‍රියාදාමය දැඩි සැලකිල්ලෙන් යුතුව නිරීක්ෂණය කරන ලදී. මෙම මැතිවරණය සඳහා ජනවාරි 18 සහ 25 කාලසීමාව අතරතුර මැතිවරණ කොමසාරිස්වරයා විසින් නාමයෝජනාපත් භාරගැනීම සිදුවිය. ජනවාරි 25 වනදින නාමයෝජනා පත් භාර ගැනීම අවසාන වනවිට පළාත් පාලන සභාවන් හී ආසන 10ක් සඳහා තරග වැදීමට අපේක්ෂකයන් 831 දෙනෙක් නාමයෝජනාපත් භාරදී තිබිණි.

මඩකලපුව මහනගර සභාව සහ එරාවූර්පත්තු, කෝරලයිපත්තු, කෝරලයිපත්තු උතුර, එරුවිල්පත්තු, මන්මුනායිපත්තු බටහිර, මන්මුනයි නිරිතදිග, පෝරතීවු පත්තු සහ මන්මුනයි දකුණු ප්‍රාදේශීය සභාවන් සඳහා මාර්තු 10 වන දින මැතිවරණ පැවැත්වෙනු ඇත. සහකාර මැතිවරණ කොමසාරිස් ටී. ක්‍රිෂ්ණානන්දලිංගම් මහතාට අනුව මෙම මැතිවරණයන් හීදී ඡන්ද පොල මධ්‍යස්ථාන 285 කදී 270,041ක් වූ සමස්ත ඡන්දදායක පිරිසක් ඡන්දය පාවිච්චි කිරීම සඳහා සුදුසුකම් ලබා සිටිති.

දිගින් දිගටම පවතින ගැටුම්කාරී වාතාවරණයකදී පවතින කැලඹිලිකාරී තත්ත්වයන් තුළ ශ්‍රී ලංකාවේදී පැවැත්වෙන  පළමු මැතිවරණය මෙය නොවේ. එසේ වුවද 2006 වසරේ මැද භාගයේ සිට ප්‍රදේශයේ පැවති යුධ ක්‍රියාන්විතයන්ගෙන් පසු දිස්ත්‍රික්කය තවමත් යථා තත්ත්වයට පත්වෙමින් පවත්නා බව මැතිවරණයන් සඳහා දින නියම කිරීමේදී සැලකිල්ලට ගතයුතුව තිබුණු බව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)  කල්පනා කරයි. මීට අමතරව දිගින් දිගටම පවතින අතුරු සන්නද්ධ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය, පැහැරගැනීම් පිළිබඳ වාර්තාවන්, නීතියෙන් පරිබාහිර මරණ දඬුවම් පැමිණවීම්. 'නාඳුනන සන්නද්ධ පුද්ගලයන් විසින් කරනු ලබන බිය ගැන්වීම් හා කප්පම් ගැනීම් සහ මෙවැනි අවස්ථාවන් හිදී පරීක්ෂණ පවත්වාගෙන යැමට නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන් හට ඇති නොහැකියාව යන මෙකී සියලු කරුණු හේතුකොටගෙන දිස්ත්‍රික්කයේ බියමුසු සහ අනාරක්ෂිත භාවයෙන් යුතු පරිසරයක් නිර්මාණය වී ඇත.

මෙම මැතිවරණයට තරග කිරීමට සුදුසුකම් ඇති දේශපාලන පක්ෂ කිහිපයක් විසින් ආරක්ෂක තත්ත්වය පිළිබඳව ජනවාරි මස මුල් සතිවලදී මැතිවරණ කොමසාරිස්වරයා වෙත කරුණු දක්වීම් කළ බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ (CMEV) සැලකිල්ලට ලක්විය. කෙසේ නමුත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පැහැදිලි කළ පරිදිම, අදාළ ඇමතිවරයා විසින්  ගැසට් මගින් මැතිවරණයක් ප්‍රකාශයට පත්කළ පසු එය අවලංගු කිරීමට බලයක් කොමසාරිස්වරයා සතු නොවේ. පොලීසිය සමග එක්ව ඡන්ද අපේක්ෂකයන්ගේ සහ ඡන්දදායකයන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා පියවර ගන්නා බවද

කොමසාරිස්වරයා ප්‍රකාශ කළේය. මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු සිටින දෙමළ ජාතික සන්ධානය විසින් මැතිවරණය පැවැත්වීම වලක්වමින් අතුරුතහනම් නියෝගයක් නිකුත් කරන මෙන් ඉල්ලා සිටිමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කරන ලදී. එවැනි අතුරු තහනම් නියෝගයක් නිකුත් කිරීමට තමන්ට බලයක් නොමැති බව අධිකරණය දක්වා සිටියේය. එහෙත් මඩකලපුව දිස්ත්‍රික්කයේ මැතිවරණ ප්‍රතිඵලයට බලපෑමක් ඇතිකළ හැකි, නීතිය හා විධිමත් භාවය පිළිබඳ තත්ත්වය සම්බන්ධයෙන් වූ තොරතුරු තමන් වෙත ඉදිරිපත් කිරීමට පෙත්සම් කරුවන්ට හැකි බව අගවිනිසුරුවරයා විසින් ඔවුනට දැනුම් දුන් බව දැනගන්නට ඇත. එවැනි විටකදී එබඳු ඉල්ලුම්පතක් පිළිබඳව සලකා බැලිය හැකි බවද දැනුම් දෙනු ලැබ ඇතැයි පැවසේ.

මේ අතර ජනවාරි මාසයේ ප්‍රදේශයේ දෙමළ සහ මුස්ලිම් ජනවර්ග දෙකේම අපේක්ෂකයන්හට බලපෑ ප්‍රචණ්ඩ ක්‍රියාවන් කිහිපයක්ම එරාවූර් පොලිස් බල ප්‍රදේශයෙන් වාර්තා විය.

ජනවාරි 12 වන දින ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ (SLMC) විධායක කමිටුවේ සාමාජිකයකු වන එම්.එල්.ඒ. එම්. හිස්බුල්ලා මහතාට අයත් වාහනයකට සන්නද්ධ ප්‍රකෝපකාරී පිරිසක් විසින් අලාභහානි සිදුකරනු ලැබ ඇත. මෙය සිදුවී ඇත්තේ ඔහු මැතිවරණය පිළිබඳව කටයුතු සංවිධානය කිරීම පිණිස තම පක්ෂ නියෝජිතයන් හමුවීමට ගිය අවස්ථාවකදීය.

ජනවාරි 25 වන දින උදෑසන ඕට්ටමාවඩි ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකු වන කේ.එම්. ආදම් බාවා මහතාට අයත් එම ප්‍රදේශයේ පිහිටි නිවස වෙත නාඳුනන පිරිසක් විසින් අත් බෝම්බයක් එල්ල කොට ඇත. ඊට පෙර දින ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් ආධාරකරුවෙකු වන තවත් මුස්ලිම් ව්‍යාපාරිකයෙකු වූ ඒ.එල්.එම්. ඉස්මායිල් මහතාගේ හිරාත් පල්ලිය අසල පිහිටි නිවස වෙත තවත් අත්බෝම්බයක් එල්ල කරනු ලැබ ඇත.

ජනවාරි 27 වන දින සවස එරාවූර් පොලිස් බල ප්‍රදේශයේ සදාම් හුසේන් ග්‍රාමයෙහි දී එක්සත් ජනතා නිදහස් සංධානයේ (UPFA) තරග කරුවෙකු වූ මොහොමඩ් හලීතීන් මහතාට නාඳුනන සන්නද්ධ පුද්ගලයන් විසින් පහරදී තුවාල සිදුකොට ඇත. එරාවූර්හී හිදායාත් නගර්හී පැවති මැතිවරණ රැස්වීමකට සහභාගි වී ආපසු පැමිණෙමින් සිටියදී ඔහුට මෙසේ පහර දෙනු ලැබ ඇත.

ජනවාරි 25 වනදා එක්සත් ජනතා නිදහස් සන්ධාන (UPFA) අපේක්ෂකයෙකු වූ සංකරදාස් සිවනන්දදාස් (54) මහතා තම නිවසේ සිටියදී නාඳුනන සන්නද්ධ පුද්ගලයන් විසින් සුදු පැහැති වෑන් රථයකින් පැහැරගෙන යනු ලැබ ඇත. පසුව ඔහු එරාවූර් පොලිස් බල ප්‍රදේශයෙහි මීලාම් පාවෙලි ප්‍රදේශයෙහිදී නිදහස් කරනු ලැබ ඇත. ඔහුට තදබල ලෙස පහර දී තිබිණි.

ජනවාරි 30 වන දින පාන්දර ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රස් (SLMC) අපේක්ෂයෙකු වූ මොහාමඩ් අයතුල්ලා මහතාගේ වාලච්චේනයි හී පිහිටි නිවස වෙත නාඳුනන පුද්ගලයන් විසින් අත්බෝම්බ දෙකක් එල්ල කරනු ලැබ ඇත.

මෙම සිදුවීම් වලට හා වැඩි ආරක්ෂාව පතා ඇතැම් අපේක්ෂකයන් විසින් කරනු ලැබූ ඉල්ලීම්වලට ප්‍රතිචාරයක් ලෙස මඩකලපුව දිසාපති අරුමයිනායගම් මහතා විසින් පොලිස් හා මැතිවරණ නිලධාරීන් සහ ඡන්ද අපේක්ෂකයන්ගේ රැස්වීමක් ජනවාරි 28 වන දින පැවැත්වීමට යෙදුනි. එහිදී අපේක්ෂකයකු විසින් ඉල්ලා සිටින විටකදී ආරක්ෂක පියවරක් ලෙස, පොලිස් භටයන් දෙදෙනෙකු බැගින් සැපයිය හැකි බව දැනුම් දෙනු ලැබිණි. පොලිස් දෙපාර්තමේන්තුවට අනුව පෙබරවාරි 13 වන දින වන විට මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ පැමිණිලි 18ක් ලැබී ඇති අතර ඒවායින් බහුතරය සුළු සිදුවීම් පිළිබඳව වූ ඒවා වෙයි. කෙසේ නමුත් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ නිරීක්ෂණයන් මගින් පෙන්නුම් කරනු ලැබ ඇත්තේ මැතිවරණයන් පැවැත්වීමට නියමිතව පවතින ප්‍රදේශයන්හී පවතින තර්ජනය කිරීමේ හා බිය ගැන්වීමෙහි මට්ටම් විශාල වන බව හා එහෙයින් තරග කරන පාර්ශවයන්හී බොහෝ බලහත්කාරී හැසිරීම් පිළිබඳව වාර්තා නොවන තත්ත්වයක් පවතින බවය.

මඩකලපුව ජනතාවට ඔවුන්ගේ ස්වාධීන දේශපාලන මතය ප්‍රකාශ කිරීමට ලබාදුන් අවස්ථාවක් ලෙස තමන් මෙම මැතිවරණය නොසලකන බවට අපගේ ප්‍රාදේශීය හවුල්කාර සංවිධානයන් බොහෝමයක් විසින් අප වෙත පලකල අදහසට ගරු කිරීමක් ලෙස සහ ඉහත කරුණු පදනම් කොටගෙන, බිම්මට්ටමේ පවතින තත්ත්වය නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා හිතකර නොවේය යන අපතුළ පවතින විශ්වාසය මත පදනම්ව, අතීතයේදී පැවති අනෙක් මැතිවරණයන් නිරීක්ෂණය කළ ආකාරයට මෙම ඉදිරියේදී පැවත්වීමට නියමිත මඩකලපුව දිස්ත්‍රික්කයේ පළාත්පාලන මැතිවරණ නිරීක්ෂණය නො කිරීමට මැතිවරණ ප්‍රචන්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය තීරණය කොට ඇත.

කෙසේ වුවද මැතිවරණ ක්‍රියාදාමය පිළිබඳව නිරවද්‍ය වාර්තාකරණයක් සහතික කිරීම සඳහා වන අපගේ අඛණ්ඩ කැපවීමේ ප්‍රකාශණයක් ලෙස මැතිවරණයට පෙර සතියක කාලයක් තුළ, මැතිවරණ දිනයේ එනම් මාර්තු 10 වනදා සහ මැතිවරණයෙන් පසුදින කිහිපයක කාලයක් තුළ මඩකලපුව දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක ජංගම නිරීක්ෂණ කටයුතුවල යෙදෙන ස්වාධීන උත්සාහයන් කිහිපයකට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) විසින් තම සහායයන් ලබා දෙනු ඇත.

2006/2007 යුධ ප්‍රහාර සමය තුළ දැඩිලෙස පීඩාවට පත් මඩකලපුවේ ජනතාවට නිදහසේ තම දේශපාලන ක්‍රියාකාරීත්වයන් හී යෙදීමට ඇති අයිතිය අහිමිවීම පිළිබඳව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) විසින් තම කනගාටුව ප්‍රකාශකොට සිටී.

සුනන්ද දේශප්‍රිය
කැඳවුම්කරු